**යාපනය විශ්වවිද්‍යාලය - 2023**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනයකළ මතය**

යාපනය විශ්වවිද්‍යාලයේ(“විශ්වවිද්‍යාලය”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 23,415,770 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 ට අනුව ආදායම ලෙස හඳුනා ගැනීමකින් තොරව සීමා කරන ලද අරමුදල් (Restrited Fund) ගිණුමට බැර කර තිබුණි. එමනිසා, සමාලෝචිත වර්ෂයට අදාළ සීමා කරන ලද අරමුදල(Restrited Fund) සහ අතිරික්තය එම වටිනාකමෙන් පිළිවෙලින් වැඩියෙන් සහ අඩුවෙන් දක්වා තිබුණි. | මෙම නිශ්චිත පරිත්‍යාග ක්‍රියාකාරකම් අපගේ සංවිධානය තුළ පවතින ව්‍යාපෘතියක් නියෝජනය කරනු ලබන බව. මෙම ක්‍රියාකාරකම් වලින් උපයන ආදායමේ මූල්‍ය ක්‍රියාකාරිත්වය පැහැදිලි කිරීම අත්‍යවශ්‍ය බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනු්කූලව ආදායම හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 50 වැනි ඡේදය අනුව එකම ස්වභාවයේ හෝ එකම භාවිතයට අනුව වර්ගීකරණය කිරීමකින් තොරව දේපළ, පිරියත සහ උපකරණ යටතේ පුනරුත්ථාපන ව්‍යාපෘතියක් ලෙස රු. 16,374,485 ක් දක්වා තිබුණි. | අප විසින් සිදු කර ඇති පුනරුත්ථාපන ව්‍යාපෘති අපගේ දේපල, පිරියත සහ උපකරණ වැඩිදියුණු කිරීමට සෘජුවම දායක වන වත්කම්වල සැලකිය යුතු ආයෝජනයක් නියෝජනය කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියේ අරමුදලින් රු. 220,700,622 ක් වැයකර 2022 වර්ෂයේදී නිම කර භාර දෙන ලද පරිගණක විද්‍යා ගොඩනැගිල්ල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව අතීතානුකූලව ගැලපීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ හුවමාරු නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ගොඩනැගිල්ලේ වටිනාකම | යාපනය විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණ මාර්ගෝපදේශ යටතේ, දේශීය හෝ ජාත්‍යන්තර මූලාශ්‍රවලින් භාණ්ඩ හෝ අරමුදල් මාර්ගයෙන් ලැබෙන ඕනෑම පරිත්‍යාගයක් හෝ ත්‍යාගයක් මූල්‍ය කමිටුවේ නිර්දේශ මත පාලක සභාවට වාර්තා කළ යුතුය. පාලක සභාව අනුමත කළ පසු, ගිණුම් හා මූල්‍ය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනිතගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය රු. 6,437,101 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රකාශනවල නිසි ලෙස සටහන් කර ගැනීම සහතික කරන ලෙස මූල්‍ය ශාඛාව වෙත දැනුම් දීම සිදු කරනු ලබන බව. | |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දී මිලදී ගෙන තිබූ රු. 13,142,949 ක් වටිනාකමැති වත්කම් ගිණුම් ගත නොතිබුණි. | ප්‍රාග්ධන ප්‍රසම්පාදන සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීම් සිදු කරන විට පමණක් ගිණුම්වල සටහන් කරනු ලබන බව. | වර්ෂය තුළ මිලදී ගනු ලැබූ සියලුම වත්කම් ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීම (AHEAD) මගින් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 250,609,496 ක් 2021 සිට ගිණුම්ගත කර නොතිබුණි. | පාලක සහා අනුමැතිය මත, මෙම ව්‍යාපෘතිය 2024 මූල්‍ය වර්ෂයේ කෙරීගෙන යන වැඩ ගිණුමේ නිසි ලෙස සටහන් කර ඇති බව. | වර්ෂය තුළ ලැබෙන සියලුම පරිත්‍යාග ගිණුම්වලට ගත යුතුය. |
| (ඇ) | ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් ඒකාබද්ධ ගොවිපළ සහ පුහුණු මධ්‍යස්ථාන ක්‍රියාකාරකම් සඳහා 2015 වර්ෂයේදී පරිත්‍යාග කරන ලද පුලියන්කුලමෙහි පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල මෙම වාර්තාවේ දිනය දක්වාම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ දෙපාර්තමේන්තුව විසින් නිල භාරදීමේ ක්‍රියාවලිය තවමත් කෙරෙමින් ඇත. මෙම විධිවිධාන සම්පූර්ණ කර නිසි පරිදි වාර්තා කළ පසු විශ්වවිද්‍යාලයට අයත් වත්කම් ලෙස නිවැරදිව හඳුනාගන්නා බව. | ඉඩම සහ ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ දක්වා ඇති රු. 7,056,150 ක මුදලක් වසර 04 සිට වසර 07 දක්වා කාලපරිච්ඡේදයක් තුළ නොපියවී පැවතුණි. | හිඟ මුදල පිළිබඳව විශ්වවිද්‍යාලය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් පවතින බව. අමාත්‍යාංශයෙන් මුදල් ලැබුණු පසු, ලැබිය යුතු මුදල් කඩිනමින් පියවනු ලබන බව. | නියමිත කාලයට නියමිත මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(2) සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | (i) | අවස්ථා 68 කදී ලබා දී තිබූ එකතුව රු.5,269,725 ක අත්තිකාරම් දින 14 සිට දින 104 දක්වා ප්‍රමාද කාලයකින් පසු පියවා තිබුණි. | දැඩි ක්‍රියාමාර්ග ගෙන ඇති අතර නියමිත කාලය තුළ අත්තිකාරම් පියවීම සඳහා සියලුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා අභ්‍යන්තර මූල්‍ය චක්‍රලේඛ නිකුත් කර ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| | | (ii) | අත්තිකාරම් ලබාදිය හැකි උපරිම සීමාව ඉක්මවා අවස්ථා 12කදී එකතුව රු.3,358,700 ක් ප්‍රධාන ගණන්දීමේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා මගින් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව ලබා දී තිබුණි. | සියලුම අත්තිකාරම් උපරිම සීමාව වන රු.100,000.00 චෙක්පත් ලබා දී තිබුණු අතර කිසිදු තත්ත්වයක් යටතේ චක්‍රලේඛ උල්ලංඝනය කර නොමැති බව. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX වන පරිච්ඡේදයේ 3 වන වගන්තිය | (i) | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල දී වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 2,878ක් ගෙවා තිබුණි. | ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාන්‍යයෙන් පැමිණීමේ ලේඛනයේ අත්සන් නොකරන අතර මෙම කාරණය 2017 නොවැම්බර් වන 11 දින පැවති කෝප් රැස්වීමේදී සතුටුදායක ලෙස පැහැදිලි කරන ලද බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| | | (ii) | අනධ්‍යාන කාර්යය | ඇඟිලි ස්කෑනරයක් භාවිතයෙන් කාර්ය මණ්ඩලයේ පැමිණීම | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මණ්ඩලයේ පැමිණීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් තහවුරු කිරීමකින් තොරව අතිකාල සහ නිවාඩු දින වැටුප් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු. 28,628,818 ක් ගෙවා තිබුණි. | සහ පිටවීම තහවුරු කිරීම සඳහා නව ක්‍රමයක් හඳුන්වා දෙනු ලබන බව. මෙම ක්‍රමය දැනට පවතින පැමිණීමේ ලේඛනයට ප්‍රතිස්ථාපනය කරනු ලබන බව. | |
| (ඇ) | 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛය | විභාගය පවත්වා මාස 3ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවද 2019 වසරේ සිට 2023 වසර දක්වා කාලපරිච්ඡේදය තුළදී විශ්වවිද්‍යාලයේ පීඨ 11ක පැවැත් වූ විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 04 සිට මාස 27 දක්වා කාලයක් ගත වී තිබුණි. | විභාග ප්‍රතිඵල නියමිත වේලාවට නිකුත් කිරීම සහතික කිරීම සඳහා දැඩි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇති බව. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ ඡේද අංක 05 | බැඳුම්කර ලෙස අයවූ රු.61,776,055ක මුදල භාණ්ඩාගාරය වෙත යවා නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | බැඳුම්කර ලෙස අයවූ මුදල භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.115,076,218 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.619,414,916ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.734,491,134 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන සහ හුවමාරු නොවන ගනුදෙනු වලින් ලැබෙන ප්‍රාග්ධන ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා විදේශගත වූ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අසූදෙනෙකු (80) සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විසි එක්දෙනෙකු (21) ශිෂ්‍යත්ව අවසන් කර නැවත රාජකාරි සඳහා වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, 1980 සිට 2023 දක්වා කාලපරිච්ඡේදයට අදාලව ගිවිසුම් කඩ කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු. 166,298,684 ක්වූ බැඳුම්කර වටිනාකම අය කර ගැනීමට විශ්වවිද්‍යාලය විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බැඳුම්කර පැහැර හරින්නන් විසින් උකස් කර ඇති බැඳුම්කර දේපළ හරහා ඉතිරි බැඳීම් අය කර ගැනීමටත්, සියලු පැහැර හැරීම් සඳහා ඉල්ලීම් ලිපි යැවීමටත් නීති දෙපාර්තමේන්තුව හරහා නීතිමය පියවර ගැනීමටත් තීරණය කර ඇති බව. | වගකිවයුතු නිලධාරීන්ගෙන් බැඳුම්කර මුදල් අයකර ගැනීමට වහා පියවර ගත යුතුය. |